# සංක්‍රමණිකයකුගේ සටහන

## නොවැම්බර් 13 මතකය

මානව ඉතිහාසය පුරාම සත්‍යවාදීන් මුහුන දෙන ඉරනම බොහෝ සෙයින් කටුකය. බිහිසුනුය. පාලකයින් විසින් නලා පෙලා ඝාතනය කොට යටපත් කරනු ලැබීමට තැත් කරන සත්‍යයම කෙදින හෝ සියළු කඩතුරා ඉරා දමා සුනු විසුනු කරමින් යලිත් මතුවන බව ලෝක විප්ලවවාදී සටන් ඉතිහාසය අපට පසක් කොට තිබේ. අදින්වසර 18 කට පෙර එජාප රජය විසින් කෘෂර ලෙස වෙඩි තබා ඝාතනය කරන ලද රෝහන විජේවීර නම් අව්‍යාජ සටන් සගයා හා ඔහුගේ මූලිකත්වයෙන් ගොඩ නගන ලද ජනතා විමුක්ති පෙරමුණ නමැති පක්ෂය ද අපට යපි සිහියට නගන්නේ ද එයයි. ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසය තුල නිර්ධන පන්තික ජනතාවගේ සුවසෙත සඳහා අවංක හා ප්‍රායෝගික වැඩපිළිවෙලක් වෙනුවෙන් වෙහෙසුන හා ඒ වෙනුවෙන් තම ජීවිතය පුදු කල එකම විප්ලවීය නායකයා ද ඔහුම වෙයි. එසේ නම් මේ ඉල්මහ යලි සැමරෙන් ඒ අව්‍යාජ මිනිසාගේ ජීවිතය හා ඔහුගේ දේශපාලන ක්‍රියාකාරීත්වය දෙස මැදහත් සිතින් බැලීම අපගේද යුතුකමක් නොවන්නේ ද?

30 දශකයේ ආරම්භ වී 60 දශකය දක්වා වූ දශක කිහිපයක් තුල මෙරට බිහිවී වැඩුණු පැරණි ශ්‍රී ලාංකික වාම ව්‍යාපාරය පැවති ධනපති රාජ්‍යයෙන් සමාජයට ලබා ගත හැකි යම් අයිතීන් ප්‍රමාණයක් ලබා ගැනීමෙන් ඔබ්බට ගිය දේශපාලනයක නිරත වූයේ නැත. එකී අරගලයට නායකත්වය දුන් ඉහළ මධ්‍යම පංතික ප්‍රභූ සමාජ ස්ථරයේ කොටස් කරුවන් වූ බටහිරින් මාක්ස්වාදය උගත් ඔවුනට අවශ්‍ය වූයේ සමාජ ප්‍රතිසංස්කරණ අරගලයන් මිස සමාජය වෙනස් කරන විප්ලවවාදී අරගලයන් නොවේ. බ්‍රිතාන්‍ය පාලනය තුල සිරවී සිටි ශ්‍රී ලාංකික නාගරික පංතියට මේ සටන් ආශ්වාද ජනක වුවත් වේගයෙන් සංවර්ධනය වන සමාජය ඉදිරියේ 60 දශකය වන විට මේ සටන්වල වලංගුභාවය අහෝසි වෙමින් යන්නේය. පැරණි වාම දේශපාලනය හා ප්‍රතිසංස්කරණවාදී සටන් ව්‍යාපාරද අභාවයට යන්නේද ඒ නිසාය. ඒ අනුව පවතින සමාජ පීඩනය හමුවේ විවෘත වන්නේ නව වාම ව්‍යාපාරයකට ඇති ඉඩකඩය. රෝහණ විජේවීර සොයුරා ප්‍රයෝගිකව ප්‍රරෝගාමී වන්නේ මේ කටයුත්ත සඳහාය. ඔහු දැඩි ලෙස අවධාරනය කරන්නේ සමාජ ප්‍රතිසංස්කරණ අරගලවලින් ඔබ්බට යායුතු සමාජ පෙරලියන් කල හැකි විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමේ අවශ්‍යතාව ගැනය. ඒ සඳහා සක්‍රියව වැදගත් වන

ඔහුගේ උත්සහය ප්‍රතිඵල දරන්නේ ජනතා විමුක්ති පෙරමුණ නම් වූ නව විප්ලවවාදී පක්ෂය ගොඩනැගීම හරහාය. එය සැබෑ ලෙසම සමාජ ප්‍රතිසංස්කරණවාදී සටන් වලින් එහාට ගිය සමාජය වෙනස් කිරීමේ, සමාජවාදී සමාජ ක්‍රමයක් ගොඩනැගීමේ පූර්ණ කැපවීමකින් යුත් කාඩර්වරුන්ගෙන් යුත් පක්ෂයක් බවට පත් කිරීම ඔහුගේ අභිලාෂය විය. ඒ සඳහා ඔහු දිවයින පුරා යමින් පූර්න කාලීන දේශපාලනය කරන සොයුරන් ගොඩනැගීය. ඔවුන් දැනුවත් කිරීම සඳහා සමාජය හා දේශපාලනය පිළිබඳව නිර්මානාත්මක අධ්‍යාපන වැඩපිළිවෙලක් සැකසීය. එය ඒ වන විට කිසිදු වාම ව්‍යාපාරයක් අත නොගැසූ කාර්යක් විය. සැබෑ ලෙස ඔහු දැවැන්ත මිනිසෙකු විය. ඔහු විශ්වාස කල අරමුණ කරා දෘඩතර අධිෂ්ටානයකින් නොකඩවා ගමන්කල විශිෂ්ටයෙකු විය. ඔහුගේ සුවිශේෂී දක්ෂතාවය නම් අනාගතයේදී මතු විය හැකි අභියෝගතා කල්තියා දැකීමේ හැකියාවයි. පක්ෂය ගොඩනැගීමෙන් පසු ඔහු මුහුණ දුන් අභියෝග හා ප්‍රතිවිරෝධතාවයන් පැරණි වම මුහුණ දුන් අභියෝගයන් හා වෙනස් වන්නේ කෙසේද? විජේවීරයන් පක්ෂය ගොඩ නැගීමෙන් පසු ඒකායන අරමුණ වූයේ ධනපති ක්‍රමය පෙරලා දමා සමාජවාදී සමාජ ක්‍රමයක් ගොඩනැගීමය. මෙය පැරණි වම හමුවේ ධනපති පංතිය මුහුණ දුන් අභියෝගයන්ට සපුරා වෙනස් හා

දරුනු වූයෙන් ප්‍රතිඵලය වූයේ පැවති අධිරාජ්‍යවාදී ගැති සියළුම බලවේගයන් විජේවීර හා ගැටීම පෙලට සිටීමය. එහි අවසන් ප්‍රතිඵලය අප අත්විඳ සිටින්නෙමු. අප සියල්ලන්ම අවබෝධ කරගත යුතු සත්‍ය නම් විජේවීර හා අප මුහුණ දුන්නේ පැරණි වම මුහුණ දුන් දේශීය ධනපති පංතිය මෙන් නොව සකල අවි අමොරා ගත් අධිරාජ්‍යවාදී සහය ලබා ගත් බලවේගයන්ගේ ප්‍රචන්ඩ ප්‍රහාරයකට බවය. ඒ ප්‍රචන්ඩ රුදුරු ප්‍රහාරයනට විජේවීර හා මුහුණ දුන් ආකාරය පිළිබඳව සමාජය තුල යම් විවේචන ඇතිවීම නොවැළැක්විය හැකි ය.

විජේවීරයන්ද පරිපූර්ණ වශයෙන්ම නිවැරදි පුද්ගලයෙකු නොවන්නටද පුළුවන. එහෙත් අප නිසි ලෙස අවබෝධ කරගත යුතතේ වැරදි සිදුවුනි නම් ඒ කුමන පරිසරයක කුමන තත්වයක් තුලද යන්නයි. සබෑ ලෙසම ඔහු මුල් වූයේ ශ්‍රී ලාංකීය සමාජය තුල පෙර කිසිවෙකු අත නොගැසූ කටයුත්තක් ඉටු කිරීම සඳහාය. ඒ සඳහා ඔහු ක්‍රියාත්මක වූයේ වඩා සංවර්ධනය වූත්, බලවත් වූත්, සංකීර්ණ වූත් සමාජ පසුබිමක් තුලය. ඔහුට මුහුණදීමට සිදුවූයේ කිසිම ව්‍යාපාරයක් මුහුණ නොදුන් බරපතල ප්‍රතිවිරෝධයනට ය. ඒ සියල්ලටම නොසැලී අභීතව මුහුණ දුන් ඒ විසල් මිනිස් නායකයා, සහෝදරයා දැන් අප අතර නැත. බේදජනක ලෙස අවසන් වූ අරගල දෙකක් පසු කරමින් සමාජය ඉදිරියට ගමන් කරමින් සිටී. ඔහු අහිමි වී දශක දෙකකට පසුවද සමාජය විසින් බල කරමින් ඉල්ලා සිටින්නේ ඔහු එදා මුල පිරූ කර්තව්‍යය ඉටු කරනා ලෙස නොවේද?

(විජේවීර සොයුරා ගැන කථා කිරීමේදී ඔහු ගැන වචනයක් කථා කළා නොව ඒ සමගම ජනතා විමුක්ති පෙරමුණ බිහි කිරීමේ ලා දායක වුනු ලේ කඳුළු දැනදිය හෙලූ සොයුරන්වද 71දී හා 89දී ඒ වෙනුවෙන් දිවි පිදූ ලක්ෂයකට ආසන්න සොයුරන්ද සිහි කළ යුතු බව සඳහන් කරන්නෙමු.)

## සොරා කෑම සහ උළා කෑම

3zzz සිංහල සේවය ගැන නොලියා ඉන්නට කොයි තරම් හිත හදාගෙන හිටියත් මේ අය ගේ පිස්සු කෙලි දකින විට ඇහෙන විට නොලියා ඉන්නේ කොහොම ද? මාධ්‍යවේදී මිතුවරුනි. කොපි කිරීම සහ නිර්මානශීලී අනුකරනය අතර ලොකු වෙනසක් තියෙනවා. වෙනත් අයෙක් වෙහෙස මහන්සිවී ගොඩ නගා ජනතාව ඉදිරියට ගෙනැවිත් ජනප්‍රිය වූ නිර්මානයක් ඒ හැටියටම අමු අමුවේ කොපි කිරීම මාධ්‍ය සදාචාරයට කොයි තරම් දුරට ගැලපෙන්නේද යන්න පැත්තක තියමු. එවන් දෙයක් කරන්නට තමන් තුල විලි ලැජ්ජාවක් නැති කම ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කිරීම අසා සිටින අපේ සිත් තුළ ඇති කරන්නේ වචනයෙන් කිව නොහැකි තරමේ අපලක්.

මේ සටහන ලියන්නට සිදුවුනේ අලුතින් ආරම්භ කර කෙටි කලකින්ම ජනතාව අතර ඉතා විශාල ජනප්‍රියත්වයක් දිනාගත් ගුවන් විදුලි සේවයක ජනප්‍රියම වැඩ සටහනක් අමු අමුවේ කොපි කර 3zzz සිංහල සේවයෙන් ඉදිරිපත් කළ නිවේදකයා කෙරෙහි මගේ අප්‍රසාදය පළ කරන්නටයි.

වෙනත් ගුවන් විදුලි සේවාවන් සමග තරග කිරීම හොඳ දෙයක්. නමුත් ඒ සඳහා කල යුත්තේ ඒ ගුවන් විදුලි සේවාවන්ගේ ඇති ජනප්‍රිය වැඩ සටහන් විලිලැජ්ජාවක් නැති ලෙස කොපි කිරීම නොවෙයි. අලුත් නැවුම් වැඩසටහන් නිර්මානය කර ඉදිරිපත් කිරීමයි.

ඔබ මේ අපට පෙන්වා දෙන්නේ නිර්මාණාත්මකව ඔබ කොයි තරම් බංකොලොත් ද යන කාරනයයි.

## මෙන්න වැඩ....!

අම්පාර රෝහල නෙවෙයි (ඉස්පිරිතාලේ) කිව්වහම ඔබේ හිතේ මැවෙන ස්ථානය කොහොම එකක්ද? විස්තර අවශ්‍ය නැහැ අපට හිතාගන්න පුළුවන්. ඒත් මිතුවරුනි, ඔබේ හිතේ මැවුනු ඒ රෝහල මුළු දකුණු ආසියාවෙන්ම හොඳම රොහල බවට පත්වී සම්මාන දිනූ ප්‍රවෘත්තිය ඔබට විශ්වාස කළ හැකිද? පුදුමයි ඒත් ඇත්තයි.

**"කළ නොහැක්කක් නොමැත."** ඒක තමයි ආමි කොමන්ඩෝස්ලගේ සටන් පාඨය. හිතුවොත් දෙයක් කරන්න කොමන්ඩො වෙන්නම ඕනෙ නැති බව අම්පාර රෝහල භාර මුළු ලංකාවටම තිලකයක් බඳු වූ ලංකාතිලක ජයසිංහ මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ඔප්පු කරලා තියෙනවා. අර යුනිට්, මේ තියටර්, තට්ටු ගගන් වාට්ටු දොස්තරවරු, හෙදියෝ, උපස්ථායකයෝ කට පිරෙන්න සපයලත් අගනුවර ඇතුළු සියලු සැප පහසුකම් වලින් අනූන දිවයිනේ කිසිම රෝහලකට කරන්න බැරිදෙය දෙයක් අම්පාර රෝහලේ කාර්ය මණ්ඩලය කලේ කොහොමද? සැබැවින්ම අවශ්‍ය වන්නේ නිවැරදි දැක්මක්, කැපවීම හා අධිෂ්ඨානය පමණයි. එය ඔවුන් ප්‍රායෝගිකව ඔප්පු කර පෙන්වා හමාරයි. අති දුෂ්කර පලාතක රෝහලක් දකුණු ආසියාවේ පළවෙනි තැනට ගෙන ඒමේ කතන්දරය තුල අපට ලැබී ඇති වැදගත්ම සංඥාව කුමක්ද මිතුවරුනි, මුළු රටේම ඇති විනයකින් තොර, සෙවන අතිරික්තයක් ඇති, පාඩු ලබන සියලු රාජ්‍ය ආයතන, සංස්ථා, මණ්ඩල ගොඩනැගීමට නම් සියල්ල පොදිගලිකරණය කල යුතුය යන තැනට අපේ මනස ගොඩනගමින් යන අතරතුර, එය මෙසේ නොවේය, විය යුත්තේ මෙසේය මේ සියල්ල ගොඩගත හැකිය, අවශ්‍ය වන්නේ මගපෙන්වීම හා කැපවීම පමණක්ය යන පණිවිඩය අම්පාරෙන් දැන් රටට පමණක් නොව ආසියාවටම ලැබී තිබේ. මේ ආදර්ශය මුළු රට පුරාම ව්‍යාප්ත කිරීමට කටයුතු සලසා දීමය. එය මෙසේ නොවන්නේ නම් රටට ලැදි පුරවැසියන් වශයෙන් අපගේ යුතුකම් වන්නේ එවැනි ප්‍රායෝගික වැඩක් රටට පුද කල ඒ කාර්ය මණ්ඩලය දිරිමත් කිරීමට පෙල ගැසීමයි. ඒ සඳහා ඉදිරියේදී වැඩපිළිවෙලක් මෙරට සකස් වෙමින් පවතී. ඒ පිළිබඳව අවධානයෙන් සිටින්න.

## සුපර් ස්ටාර්ස් හා උන්මාදය

ඔස්ට්‍රේලියාවේ ඉන්න ශ්‍රී ලාංකිකයොත් දැන් සුපර් ස්ටාර්ල ගැන අහල දැකල අවබෝදයකින් ඉන්නෙ. තරග අවසානයට පසු ශ්‍රී ලංකාවේ ද ඇතුලුව අපේ කට්ටිය මේ තරගය පුරාවටත් අවසානයටත් ඇතිවුණ රසික උන්මාදය ගැන කරන විවේචන කොයි තරම් දුරට සාධාරන ද? මධ්‍යස්ථව හිතුවොත් රසික උන්මාදයක් නැත්නම් කලාවක්

14 වන පිටට




## ගාමිණී රණසිංහගේ ත්‍රිවිධ සාර්ථක උත්සාහයකි

සංක්‍රමණිකයාට පිලිතුරක්

ගාමිණී රණසිංහ ගේ ත්‍රිවිධ නාට්‍ය උළෙල පිළිබඳ පසුගිය සන්නසේ සංක්‍රමණිකයාගේ සටහන සම්බන්ධව යම් අදහස් දැක්වීමක් කිරීම සුදුසු යයි මට සිතෙයි.

සංක්‍රමණිකයා ලෝකය දකින්නේ බොහෝ විට දේශපාලන අදසකිනි. කලා කෘතියක් අරබයා වුව ද ඔහුගේ දැක්ම දේශපාලනයෙන් තොර නොවෙයි. එහි වරදක් නැත. සමස්ථ සිංහල නාට්‍ය ක්ෂෙත්‍රයේ අද අර්බුදය පිළිබඳ සංක්‍රමණිකයාගේ මතයට අප ද එකඟ ය. අද වන විට සිංහල නාට්‍යය සරළ හාස්‍යය පමණක් ප්‍රේක්ෂකයාට පුදන සිනා ෆැක්ටරි බවට පත්ව ඇත. එය බෙදනීය තත්වයකි. ප්‍රවීණ නාට්‍ය කරුවන් පවා අද මේ රැල්ලට හසුව යන සැටි අප බලා සිටිනේනේ වේදනාවෙනි. සුගතපාල ද සිල්වා ධර්මසිරි බණ්ඩාරනායක ජයන්ත චන්ද්‍රසිරි නැති අඩුව අද සිංහල වේදිකාවට තදින්ම දැනෙයි.

සමස්ත චිත්‍රය එසේ වුව ද ගාමිණී රණසිංහ ගේ ත්‍රිවිධ දෙස අප හෙළිය යුත්තේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන නාට්‍යයක් දෙස හෙළන බැල්මට වඩා මාදු බැල්මක් යයි මට සිතෙයි. එයට හේතු කාරණා රැසකි.

ගාමිණී සිය නාට්‍යය අපට ගෙන එන්නේ නාට්‍යකරණයට බොහෝ අවාසිදායක පරිසරයක සිට ය. නිවි සැනසිල්ලේ නාට්‍යයක් කිරීමේ පරිසරයක් මෙහි නැත. සියල්ල සිදුවන්නේ යන්ත්‍ර මෙන් ඉසිඹුවක් නොලබා හැල්මේ දුවන තරගයක යෙදී සිටින අතරතුර දී ය. එවන් පරිසරයක බිහිවන නාට්‍යයකට ආවේනික ගති ලක්ෂණ ත්‍රිවිධ තුළ දකින්නට ලැබුණ ද සමස්තයක් වශයෙන් ගත් කළ ගාමිණී ඉතා හොඳ නිර්මාණයක් කර ඇති බව සටහන් කර තැබිය යුතුම ය.

ඔහුට මේ සඳහා ලැබෙන අමු ද්‍රව්‍ය ද ඉතා සීමිතය. පළපුරුදු නළු නිළියන් හිග කම ප්‍රධාන ප්‍රශ්නයක් වුව ද ඔහු ඒ අභියෝගය මැනැවින් ජයගෙන තිබුණි. ත්‍රිවිධ පණගැන්වූ රංගන ශිල්පීන් ශිල්පිණියන් එකිනෙකා නොපරදින ආකාරයේ අපූරු රංගන ප්‍රතිභාවක් ප්‍රදර්ශණය කළ බව ඔවුනට ගෞරවයක් ලෙස සටහන් කර තබමි. ගාමිණී රණසිංහ, අපිත් සිල්වා, හෙළුම් අමුණුගම, විපුල නයනානන්ද, නිෂාමනී වේරගොඩ, ධර්මසිරි ජයසිංහ, දීපානන්ද, ලක්ෂ්මන් ගමගේ, ලලිත් චූලරත්න ඇතුළු සියළුම ශිල්පීන් ඉතා සාර්ථක ලෙස සිය යුතුකම් ඉටු කර තිබෙනු අපි දුටුවෙමු. විශේෂයෙන් පොලිස් නිලධාරියා ලෙස රඟ පෑ ලීලාන්නද ගලප්පත්ති තමාට ලැබුණ සුළු වපසරිය තුළ දක්වූ ප්‍රතිභාව අගය කළ යුතුම ය.

වේදිකා සැළසුම හා අංග රචනය ද(අපිත් සිල්වා හා ලෙලෙනි ජයසිංහ ට මල් මිටක්) විශිෂ්ට මට්ටමක තිබුණි.

ත්‍රිවිධ නාට්‍ය උළෙලේ තිබූ නාට්‍ය හතරම හාස්‍ය නාට්‍ය නොවූ බව අමතක කළ යුතු නැත. ප්‍රාතිභාර්යය හාස්‍ය නාට්‍යයක් ලෙස වර්ග කල නොහැකි ය. හාස්‍ය නාට්‍ය ලෙස ඉදිරිපත් වූ නාට්‍ය තුන තුළින් ද ගාමිණී සමාජය ලෙස යම් විවේචනාත්මක බැල්මක් හෙළා තිබුණි. සංක්‍රමණිකයා එය නොදැක්කා ද නැත්නම් ඔහු එය ග්‍රහණය කර නොගත්තා ද යන්න ගැටලුවකි. නැවත ඒ පිළිබඳව සිතා බලන්නැයි මම සංක්‍රමණිකයාට යෝජනා කරමි.

නාට්‍ය අතරතුර හිඩැස පුරවන්නට ගාමිණී යොදාගන්නා පොලිස් නිලධාරියා අපූරු ය. එය අපට අලුත් අත්දැකීමක් විය. නාට්‍ය අතර ඇතිවන කාන්සිය අපූරු ලෙස මඟහරවාගන්නට එයින් හැකියාවක් ගාමිණී ට ලැබුණි. එය ඉදිරිපත් කළ ශිල්පියා දැක්වූ දක්ෂතාවද ඉහළින් අගය කළ යුතු ය. එනමුදු බෝම්බයක් පුපුරාගෙන මිය යන කාන්තාවක යනු අපට සිනාසෙන්නට කාරණයක් නොවන බවට සංක්‍රමණිකයා මතු කළ අදහසට මා ද එකඟ වන බව ද නොලියාම නොහැකි ය. එය ගාමිණීට නොවැටහුණේ මන්දැයි මට තවමත් සිතා ගත නොහැකි ය.

ගාමිණී රණසිංහ අපට සිටින සම්පතකි. අප විසින් රැකගනු ලැබිය යුතු සම්පතකි. ඔහුගේ ගමන දුෂ්කර ය. ඒ දුෂ්කර ගමනේ දී ඔහුට අත දෙන්නට අපි නිබඳවම සැදී පැහැදී සිටිමු.

**ජගත් ජේ එදිරිසිංහ**